

'මා නිවත්ත අභික්කම' ~ නො නැවත ඉදිරියට යවු


| 59 වන කාණ්ඩය | බු.ව. 2560 බිනර මස පුරපසළොස්වක ද<br>ව්‍ය.ව. 2016 සැප්තැම්බර් මස 16 වන ද | 05 වන කලබ |
| --- | --- | --- |


# සිරිමත් සිරි දම්පල් උතුමනි


## ටිබෙට් එස්. මහින්ද හිමිපාණෝ


බහ තෝරපු ද ම ලංකා මාතා ගේ
මහ වීරයා වූ ඔබ ගේ ගුණ වේගේ
දහ අත පැතිර යන හැටි විමසුම වාගේ
මහ ජනයාට අද වෙන වෙන සැපතක් නෑගේ

රටත් දැයත් සමයත් වැනසෙනා හැටි
දැකත් කෙනෙක් යුතුකම් නො සලකා සිටී
නමුත් ඔබ දිවා රෑ අත නො හැර ගැටී
අදත් සිහි වේ ය ඒ ම කළ වැඩ බුහුටි

ඇතත් අප අතර යම් වරදක් ඉවසා
සුගත් සසුන ලක'ඹර පළ කරන ලෙසා
යළිත් මෙහි ම උපදින ලෙස අප උදෙසා
මහත් හඬින් යදිනෙමු දෙ අත බිම ගසා



# බ්‍රහ්ම පූජානිශංස

අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ
මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි

බඹ සුර නර යක් ඈ - සව් සතුන්ටත් උතුම් වූ
මහ බඹු යන නම් ලත් - පින් කෙතක් වන් පුතුන්ගේ
දරුවෙනි දෙගුරුන් වූ - මව් පියාණන් වහන්සේ
දින දින වැඳපල්ලා - අත් මුදුන් දී දෙ වේලේ

එලෙස මවු පියාණන් - සව් දුකින් අස් වසාලා
අහර පට වතින් හා - අන් සියල්ලෙන් පිදීමත්
දින දින නැහැවීම ත් - දූ පුතුන්ගේ පැණැත් වූ
කටයුතු ය සිතාලා - පින් ලබව් ඒ කිරීමෙන්

පින්වත් දරුවෙනි,

අප අට වන අග්බෝ මහ රජතුමා ගැන ඉතා ආදරයෙන් සිතනවා නොවේ ද? ලෝක වාසීහු ඔය දරුවන් ගැනත් එසේ ම ආදරයෙන් සිතත්වා! ලෝක

වාසීහු දරුවනට ප්‍රශංසා කරත්වා! අග්බෝ රජ තුමා තිලෝගුරු බුදු පියාණන් වහන්සේට පමණක් දෙවැනි කොට ඉතා ම ආදර ගෞරව දැක්වූයේ ස්වකීය මවු බිසොවුන් වහන්සේට ය.

ඒ රජතුමා උදෑසන ම ගොස් මෑණියන් වහන්සේ වැඳැ සිහිල් සුවඳ දියෙන් මෑණියන් වහන්සේ නහවා ඒ මෑණියන් වහන්සේගේ කිලිටි වස්ත්‍ර සේදූ වතුර ඉතා අගය කොට සිතා එම වතුරෙන් තම හිස තෙමා ගත්තේ ය. ඉන් පසු චෛත්‍ය රාජයන් වහන්සේ නමකට මෙන් මෑණියන් වහන්සේට මලිනුත් සුවඳිනුත් පූජා කොට තුන් වරක් මෑණියන් වහන්සේ ප්‍රදක්ෂිණා කරන්නේ ය. මෑණියන් වහන්සේ ආරක්‍ෂාවේ සිටින අයට ද ඔවුන් කැමති සියල්ල දෙන්නේ ය. තෙමේ ම මෑණියන් වහන්සේට මධුර වූ භෝජන සියතින් වළඳවා තෙමේ මෑණියන් වහන්සේගේ ඉඳුල් වළඳන්නේ ය. එම ඉඳුල් හිසෙහි ද විසුරුවා ගන්නේ ය. මෑණියන් වහන්සේගේ පිරිසට ද අගනා රාජ භෝජන දෙන්නේ ය.

තවද මෑණියන් වහන්සේ නිදන ගෙය සුම්හිරි සුවඳින් පුරවා එහි සිනිඳු වූ සුව පහස් ගෙන දෙන්නා වූ යහනක් මනා සේ පිළියෙළ කොට මෑණියන් වහන්සේගේ පාදයන් මෘදු ලෙස ආදරයෙන් සෝදා පතුල්වල සුවඳ තෙල් ගල්වන්නේ ය.

තවද සැප නිඳි ලැබෙන තෙක් ඉතා ආදරයෙන් මෑණියන් වහන්සේගේ පා මිරිකා එතුමිය නින්දට ගියවිට ආරක්‍ෂාව සඳහා පිරිස සිටුවා පෙනෙන තෙක් ම එතුමිය

දෙසට පිටු නො පා එදෙසට ම මූණ ලා පසු බැසැ දෘෂ්ටිපථය ඉක්මුණු කල්හි ම යා යුතු මඟ බලා යන්නේ ය. එතුමිය නොපෙනෙන තෙක් ගොසිනුදු තවත් තුන් වරක් වැඳැ ඉතා සතුටු වූ සිත් ඇත්තේ නැවත නැවතත් එ ම පින්කම සිහි කරමින් වඩ වඩා ත් සතුටු වෙමින් ස්වකීය මාලිගාවට යන්නේ ය.

මේ හොඳ දරුවෝ ද ඒ උතුම් රජතුමා මෙන් ම තම මෑණියන් වහන්සේට සැලැකිලි කෙරෙත්වා! පියාණන් වහන්සේටත් එසේම කෙරෙත්වා!

එසේ සලකන හොඳ දරුවනට මෙලොව සතුට ද දීර්ඝායුෂ ද දිව්‍ය සම්පත් ද සිදු වේ. උතුම් වූ බුදු බව ද සිදු වේ.

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●

"පිරිසිදු ජීවිතය පිළිබඳ ආදර්ශ සැපයීම පමණක් නො ව, පාපී ජීවිතයක දුර්විපාක පිළිබඳ ව තම දුබල සොහොවුරනට නිරතුරුව අවවාද කිරීමත් සද්ගුණ ජීවිතයක ඇති කීර්තිමත් භාවය පෙන්වා දීමත් පවිත්‍ර ජීවිතයක් ගත කිරීමට උනන්දු කරවීමත් භික්ෂූන් ගේ මෙන් ම උපාසක ජනයා ගේ ද වගකීම වේ. වැටුණු මිනිහා කිසි කලෙකත් නො තකා නො හළ යුතු ය. ඔහුට අනුකම්පාවෙන් සංග්‍රහ කළ යුතු ය."

**ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා**

"ධර්මපාල ප්‍රතිරාවය" කෘතියෙනි



# උතුම් චරිතාදර්ශයෙන් සසුන් පහන් ටැම් නැංවූ අපේ මඩිහේ මහානායක හාමුදුරුවෝ

"ගුරු සීයා" විසිනි

*(ශ්‍රී ලංකා අමරපුර මහානිකායේ උත්තරීතර මහානායක පදවිය හෙබැවූ, බම්බලපිටියේ සිරි වජිරාරාමය සහ මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ අධිපති ධුරය දැරී අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහානායක මාහිමිපාණන් වහන්සේ ගේ 13 වන ගුණ සමරුව නිමිත්තෙනි.)*

මඩිහේ මහානායක මාහිමියන් වහන්සේ උපන්නේ 1913 ජුනි මස 21 වැනි ද මාතර මඩිහේ දී. පියාණන් වූයේ ජේ. සී. පූජිත ගුණවර්ධන විදුහල්පතිතුමා. මෑණියන් බී. ඒ. ධීරසේකර උපාසිකා මාතාව. වේරගම්පිට සිරි රේවත මාහිමියන් වහන්සේ ගේ උපාධ්‍යායත්වයෙන්, පැළෑණේ සිරි වජිරඤාණ මහනාහිමියන් ගේ ආචාර්යත්වයෙන් උන් වහන්සේ පැවිදි වුණේ 1926 ජුනි 21 වන ද. උපසම්පදව 1933 ජුනි 09 වන ද සිදු වුණා.

පැළෑණේ මහ නා හිමියන් 1955 සැප්තැම්බර 21 ද අපවත් වීමෙන් පසුව 1955 නොවැම්බර 27 ද අමරපුර ශ්‍රී

ධර්මරක්ෂිත මහානිකායේ මහානායක පදවියට පත් වුණේ ළා බාල ම මහ නා හිමියන් ලෙස. එවිට උන්වහන්සේ ගේ වයස 42 යි.

ළා බාල වියේ පටන් ම මඩිහේ මහානායක හාමුදුරුවන් ගිහි - පැවිදි හැම දෙනාගේ ම ප්‍රසාදය දිනා ගැනීමට පින්වත් වුණා. පන්සලට එන හැම දෙනා සමඟ ලොකු පොඩි වෙනසක් නැතුව සිනා මුසු මුහුණින් පිළිගෙන පිළිසඳර කතා කළේ තරුණ මඩිහේ හාමුදුරුවෝ.

අනුන් ගේ වැරදි සොයන්නේ නැතුව තමන් ගේ අඩු පාඩු විමසා බැලීම උන් වහන්සේ ගේ චරිතයේ පෙනුණු ප්‍රකට ගුණයක්. අනුන් ගේ දොසක් ගැන කියන කතාවක් වුණත් උන් වහන්සේ ඇහුම්කන් දුන්නේ මැදහත් සිතින්. සිය ගුරුදේව නායක මාහිමියන් ලියූ පහත දැක්වෙන සිලෝ කවිය උන් වහන්සේ ගේ චරිතය හැඩ ගස්වා ගැනීමට හුඟාක් උපකාර වුණා.

මාගේ නොයෙක් වැරැදි හා අඩුකම් තියෙද්දී

කාගේ කොතෙක් වරද වත් නො සොයම් නො දක්වම්

දෙස්නෙන් මිදෙන්නට ගුණෙන් නුවණින් වැඩෙන්ටත්

වෑයම් කරම් දිනපතා සිහියෙන් යෙදී මම්

පුංචි ඔබට මතක ද කරණීය මෙත්ත සූත්‍රයේ තියෙන ගුණ කඳු පෙළ. සක්කෝ උජු සූජු සුවචෝ මුදු අනතිමානී..... මේ සියලු ගුණ ප්‍රායෝගික ව තම ජීවිතයෙන් පුරුදු කළ මහෝත්තමයෙක් තමා මඩිහේ මහානායක හාමුදුරුවෝ.

බුදුහාමුදුරුවෝ සැරියුත් හාමුදුරුවන් ගැන දේශනා කළේ "මේ සාරිපුත්ත අං කැඩිච්ච ගොනකු වගේ කෙනෙක්. පාපිස්සක් වගේ. කබලක් අතින් අරගෙන හිඟමන් යදින අහිංසකයකු වගේ. එච්චරට අනතිමානී ගුණයෙන් ඉහළ යි. වැඩිහිටියන්ට ගුරුවරුන්ට බොහොම යටහත් පහත් කීකරු ගුණ සම්පන්න කෙනෙක්. බුදුරජාණන් වහන්සේ අද වැඩ සිටියා නම් මඩිහේ නායක හාමුදුරුවන්ටත් ඔය ටික ම දේශනා කරනවා.

රාත්‍රී 10 ට 10.30 ට පමණ සැතපුණු උන්වහන්සේ අලුයම 4.00 ට අදි වුණා. දවසේ තුන් වේලෙම බුදුන් වැන්ද. සසුන ගැන රට, ජාතිය ගැන ලිපි ලියන කොට සමහර දිනවල 3.00 ට ඇහැරී ඒවා කළා. උන් වහන්සේ කාලයෙන් හොඳට වැඩ ගත්තා. කාලය අපතේ යැව්වේ නැහැ.

තමා ආදර්ශවත් ව ඉඳගෙන අනුනට අවවාද අනුශාසනා කිරීම යි බුදු රදුන් අගය කළේ. "අත්තානමේව පඨමං - පතිරූපේ නිවේසයේ..."යනුවෙන් දේශනා කළේ එම කරුණයි. මඩිහේ මහනාහිමියන් කළ අනුශාසනය උන් වහන්සේගේ ජීවිතයෙන් ආදර්ශවත් වුණා. මෙය සුවිශේෂ කරුණක්.

උන් වහන්සේ අම්පිටියේ ශ්‍රී රාහුල නායක මාහිමියන් සමඟ එක් වෙලා ශාසනයට සමාජයට වැඩදායී භික්ෂු පරපුරක් හදා ගැනීමේ පරමාර්ථයෙන් මහරගම භික්ෂු අභ්‍යාස මධ්‍යස්ථානය හෙවත් සිරි වජිරඤාණ ධර්මායතනය ආරම්භ කළා. මිනිහා හදා රට හැදීම පිළිබඳව හැම තැනක දී ම අවධාරණය කළ උන්වහන්සේ

රට ධාර්මික ලෙස සංවර්ධනය කිරීම හා රටේ දුප්පත්කම නැති කිරීම පිළිබඳව පාලක පක්ෂයට නිතර අනුශාසනා කළා. පදවිය බෝගස්වැව ආදී දිළිඳු ගම්මාන දියුණු කිරීමට ලොකු වෙහෙස මහන්සියක් දැරුවා. ගම් දනවුවල චාරිකා ධර්මදේශනා කරමින් දැහැමි රටක්, සුඛිත මුදිත සමාජයක් නිර්මාණය කිරීමේ අදිටනින් චාරිකා ධර්ම දේශනා වැඩ පිළිවෙලක් ආරම්භ කළා. ශ්‍රී ලංකාව ධර්මද්වීපයක් හා පෙරදිග ධාන්‍යාගාරයක් කරලීමේ අරමුණින් ධර්මවිජය පදනම පිහිටුවා එමඟින් දීපව්‍යාප්ත ව ධර්මවිජය සමාජ ඇති කළා. ශ්‍රී ලංකා අමද්‍යප සංගමයේ සභාපතිවරයා වශයෙන් ශ්‍රී ලංකාව අමද්‍යප රටක් කර ගැනීම සඳහා සාමූහිකව විශාල උත්සාහයක් දැරුවා. මුළු රටම භීෂණයෙන් පෙළූ තිස් අවුරුද්දක යුද්ධයක් තිබුණා. ඒ ඒ අවධිවල සිටි පාලක යනට දුර දක්නා නුවණින් සැලැසුම් හා සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් ඍජුව අනුශාසනා කරමින් මඩිහේ මා හිමියන් සිදුකළ ජාතික මෙහෙවර අප විසින් සැමදා සිහි කළ කළ යුත්තක්. උතුරේ ප්‍රශ්නය ඇති වුණු මුල් වකවානුවේ දී ම එම ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා උන් වහන්සේ දූරදර්ශී ව රජයට ඉදිරිපත් කළ විශේෂ යෝජනා පහ පිළිගෙන ක්‍රියාත්මක කළා නම් රටට මෙබඳු හානිකර තත්ත්වයක් කොහත්ම ඇති වන්නේ නැහැ. එවක රජය ඒවාට ඇහුම්කන් නොදීම මුළු රටේම අවාසනාවක්.

මේ කිසි ම දෙයක් උන් වහන්සේ කළේ ආත්මාර්ථකාමී හැඟීමෙන් නොවේ. ලාභ ලෝභ කීර්ති ප්‍රශංසා බලාගෙන නොවේ. නොයෙක් දුක් වෙහෙස විඳගෙන අනුන් ගේ සුවය, පොදු යහපත වෙනුවෙන් මෙහෙයැවුණු මහ

බෝසතාණන් වහන්සේ කෙනෙකු ගේ "බෝධිසත්ත්ව චර්යාව"යි උන් වහන්සේ ගේ චරිතයෙන් මුළු මනින් ම දිස් වුණේ. අනෙක් සුවිශේෂී කරුණ තමයි, මේ එකකින් වත් උන් වහන්සේ තමන් ගේ මහණකමට සීලයට හානියක් කර ගන්නේ නැතිව ඒ සියල්ල කිරීම. නම කෙලෙසා ගන්නේ නැතිව, ආත්මාර්ථය කිලිටි කර ගන්නේ නැතිව උන් වහන්සේ සිදුකළ පරාර්ථය, පරෝපකාරය අතිශයින් ම විශිෂ්ට යි, විස්මයාවහ යි. නින්දා බැණුම් අපහාසවලට බිය නම් පරෝපකාරය නොකළ යුතුයි යන්න උන් වහන්සේ ගේ අදහස වුණා.

මහානායක මාහිමියන් වහන්සේ ඉතා ඍජු ප්‍රතිපත්ති තිබුණු සංඝ පිතෘවරයෙක්. එවක සිටි ප්‍රධාන දේශපාලන නායකයන් වජිරාරාමයේ ඇසුර ලැබූ අය වුවත් ඔවුනට සුදුසු අනුශාසය සිදු කළේ අපක්ෂපාතී ව යි. අපෞද්ගලික ව යි. කිසිදු පක්ෂ දේශපාලනයක් ඇසුරු නො කරමිනුයි. රටේත් සමාජයේත් පොදු ශුභ සිද්ධිය යි උන්වහන්සේ නිතර කල්පනා කළේ. ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා ගේ පාලන යුගයේ දී දේශපාලනිකව ගත් ඇතැම් තීරණ මහානායක මාහිමියන් ගේ දැඩි දොෂ දර්ශනයට ලක් වුණා. එසේ වුවත් තම මලණුවන් වූ දිසා විනිසුරු කෝබට් ජයවර්ධන මහතා පැවිදි වන්නට අදහස් කළ අවස්ථාවෙහි එතුමා මඩිහේ මහනාහිමියන් වෙතට යොමු කළේ ජේ. ආර්. ජයවර්ධන මහතා යි. ඒ උන් වහන්සේ ගේ පිළිවෙත්සරු ගුණයට අවංකව ගරු කළ නිස යි.

අපේ රටේ ළමා පරපුර නිසි විදිහට හද ගැනීමේ වැදගත් කම උන්වහන්සේ දුටුවේ වර්තමානය ගැන

පමණක් නො ව අනාගතය දිහාත් බලාල යි. මවු කුසේ සිට ම ජේවී දරුවන් හද ගැනීමේ බොදු පිළිවෙත උන් වහන්සේ නිතර සමාජයට පැහැදිලි කර දුන්නා. 'මිනිසා ගේ උතුම් ම වස්තුව දරුවා ය' යන බුද්ධ වචනය නිතර අවධාරණය කළේ ඒ සඳහා යි. දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳ ව උන් වහන්සේ වැඩි අවධානයක් යොමු කළේත් මේ අරමුණ ඇති ව යි. දහම් පාසල් දරුවන් හික්මවන ප්‍රතිපත්ති පහක් දහම් පාසල් ගුරුවරුන් සඳහා උන් වහන්සේ ඉදිරිපත් කළා.

1. කුල දෙවි - මාපිය - ගුරුවර - වැඩිහිටියන් පිදීමට යොමු කිරීම
2. චාම් ජීවිතයට හා සුහද වාසයට හුරු කිරීම
3. සංවර බව, විනය ගරුක බව හා ධර්මඥානය දියුණු කරවීම
4. ආගම ඇදහීමට - නිති පන්සිල් රැකීමට - පොහෝ දින අටසිල් රැකීමට උත්සාහවත් කරවීම
5. ආගමාලයෙන් පිබිදුණු, ස්වදේශ වාත්සල්‍යයෙන් ඔදවැඩුණු, ජාතිකාභිමානයෙන් මෙහෙයැවුණු, ස්වභාෂානුරාගයෙන් පණවත් වුණු දරු පරපුරක් බිහි කරවීම.

1984 අගෝස්තු 30 දතමින් කොළඹ තරුණ බෞද්ධ සංගමයේ ධර්ම පරීක්ෂණ ලේකම් ඩී. සී. ශ්‍රී දිල්ලිමුනි මහතා විසින් දිවයිනේ සියලු ම දහම් පාසල්වල ක්‍රියාත්මක කරවීම සඳහා ඉහත සඳහන් ප්‍රතිපත්ති 5 දන්වා යවන ලද්දේ මෙම පිළිවෙත්හි ඇති කාලීන වටිනාකම මැනවින්

කල්පනා කළ නිසා යි. මහරගම ධර්මායතනයෙහි ආරම්භ කරන ලද තුරුණු සවිය හා තරුණ සීල සමාදානය ද තරුණ ජීවිත හා තරුණ ශක්තිය තමාටත් අනුනටත් වැඩ සැලසෙන අයුරින් යොදා ගැනීමට පූර්වාදර්ශී මඟ පෙන්වීමක් වුණා.

එක දිවියකින් සිතාගත නොහැකි තරමේ මහ මෙහෙවරක් මඩිහේ මහානායක මාහිමියන් සිදු කළේ බෝධිසත්ත්ව චර්යාවක් ලෙසින් බව නැවත නැවතත් අවධාරණය කළ යුතු යි. ඒ අසිරිමත් මහ මෙහෙය බුදු සසුනට - රටට - දැයට - බසට ඒකාන්තයෙන් ම වැඩ පිණිස ම පැවතුණා.

මහානායක මාහිමියන් වහන්සේ ඉතා බැතිමත්ව ඇසුරු කළ අරීසෙන් අහුබුදු කලාසූරුවන් උන්වහන්සේ සිදුකළ උතුම් මෙහෙවර පහත දැක්වෙන අයුරින් මෙ දැයට නැවත පතන්නේ එහි කාලීන අවශ්‍යතාව ද සලකාගෙන යි.

සුබ ම ය ඔබ වදන උවදෙස වන දෙසට
සුබ ම ය ඔබ පැනැස දිව ඇස වන රැසට
සබ ම ය ඔබ වඩින සබ, සුබ වන හැමට
ලබ ම ය ඔබ උපත අසරණ හෙළ වගට

ඔබ බඳු උදු සුපිළිපන් යතිඳුන් වීම
සුවයෙකි රට දැයට ගෙන දෙන සැනැසීම
දුබල ව වැටෙන මෙ දැයට අද අත දීම
බඹ ලොව සිට ද කරනු ය හිමි හැම දම



# අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම අනුනාහිමිපාණන්ගේ අපවත් වීම පිළිබඳ අපගේ සංවේගය

මහෝපාධ්‍යාය අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ පසුගිය සැප්තැම්බර 07 දින උදසන අපවත් වී වදාළහ. 12 වන දින එ ම ශ්‍රී දේහය ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු සංකීර්ණ පරිශ්‍රයෙහි දී අති මහත් ජනකායක ගේ ගෞරවෝපහාර මැද රාජ්‍ය අනුග්‍රහය සහිත ව ආදහනය කරන ලදි. 1939 අප්‍රේල් 24 වන ද උපත ලද උන් වහන්සේ 1957 මාර්තු 27 දින උතුම් පැවිදි දිවියට පත් වූයේ අතිපූජනීය මාතර ශ්‍රී ඤාණාරාම, අතිපූජනීය කඩවැද්දුවේ ශ්‍රී ජිනවංශ යන මාහිමියන් වහන්සේලා ගේ ආචාර්ය උපාධ්‍යායත්වයෙනි. 1959 ජුලි 15 ද උතුම් උපසම්පද භූමියට ඇතුළත් වූහ.

අරණ්‍යවාසී ජීවිතයක් ගත කළ උන් වහන්සේ, ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවෙහි ප්‍රධාන අනුශාසකයන් වහන්සේ වූහ. අරණ්‍ය සේනාසන 180 ක පමණ අනුශාසක ධුරය දරමින් අරණ්‍යවාසී හිමිවරුනට පමණක් නො ව මුළු සංඝ සමාජයට ම උතුම් සංඝ නේතෘවරයකු ලෙස උන් වහන්සේ දුන් ආදර්ශය සුවිශිෂ්ට වූවකි.

බහුශ්‍රැත භාවය, ධර්මවිනය ධරත්වය, සුපේශල ශික්ෂාකාමිත්වය, භාවනාරාමතාව යන උතුම් ගුණවලින් මනා ව ශෝභමාන වූ උන්වහන්සේ සංඝ ශෝභන ගුණ වලින් පිරිපුන් සංඝපිතෘන් වහන්සේ නමක් වූහ. ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායෙන් උන් වහන්සේට 'මහෝපාධ්‍යාය' පදවිය සමග 'ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය ශාසනධජ' යන ගෞරව නාමය ද එම නිකායේ ගෞරවනීය අනුනායක පදවියක් ද පිරිනමන ලද්දේ උන් වහන්සේ විසින් සිදු කරන ලද උතුම් ශාසනික සේවාවට ගෞරව - උපහාර කරනු පිණිස ය.

බුරුම රජයෙන් උන් වහන්සේ වෙත "මහා කම්මට්ඨානාචරිය" ගෞරව උපාධිය පිරිනමන ලද්දේ භාවනා ආචාර්යවරයකු වශයෙන් විශිෂ්ට දැනුමෙන් මුළු බෞද්ධ ලෝකයට ම සිදු කළ ආධ්‍යාත්මික ශාන්තිය සලකා ය.

ආදර්ශයෙන් හා අනුශාසනයෙන් පරමාදර්ශයක් දුන් දුර්ලභ ගණයේ කල්‍යාණමිත්‍ර අනුශාසක සංඝනේතෘවරයකු වූ අතිපූජ්‍ය නාඋයනේ අරියධම්ම අනුනාහිමිපාණන් වහන්සේට පැතූ බෝධියෙකින් ලොවුතුරු සුව සාක්ෂාත් වේ වා යි 'බෞද්ධ ළමයා' ගෞරව - නමස්කාර පෙරටුව ප්‍රාර්ථනා කරයි.

අරණ සසුන් ආරට පැහැදී නොමඳ
අරණ නම් කෙලෙස් බිඳ හරිනුව නිබඳ
සරණ සුවඳ දුන් සැදැහැති සත සිතැ'ද
නාඋයනේ සුපිපි නා මල පර විණි ද

පිළිවෙත් සසුන දුලැවූ මහ සිල්වතෙකි
සුපසන් මහරු ගුණ මිණි රැඳි නිදහනෙකි
සසුනට නැගූ රන් හිණ නම් අසිරියෙකි
සිරිතින් විනය දිවමන් කළ සඟ පියෙකි

මඩිහේ මහා නාහිමියන් අයැදුමට
සියනෑ බුදුනු ගුරු විදුහල් බිම වෙතට
වැඩියා කමටහන් ඇදුරිඳු වී ඉ - සෙට
ලැබුණා මහරු එළි දහරක් මුළු රටට

මාතර නැණඅරම් මහ පඬි හිමිඳුනට
කඩවැද්දුවේ ජිනවස් මහ තෙරිඳුනට
සිසු පුත් රුවන වූ ඔබ ගුරු දෙව් මඟට
දුන් මහ එළිය නිසි වෙයි ඔබට මැ පුදට !

දහම් විනය නය තෙවළා වදනිසුරු
සියුම් ගැඹර තැන් පිරිසිඳි මහ ඇදුරු
නොහිම් ලෙස ගලන දිය ඇල්ලක් අයුරු
දහම් දිව'ග ලෙළ වූ අයුරු ය මහරු !

කහව ගල්දූව නාළයන සෙනසුනේ
මහිමි සැරිසැරූ අන් සෙනසුන් අරණේ
සඳ රැස් ගලන සුපහන් ලිය ගොමු හෙවණේ
හිමි තැබූ මහරු පියවර සොයමි හැම දිනේ

දෑරිය නොහැකි හිස් තැන ඇති විය සසුනේ
දිරිය පිරී ඉතිරිණි ඔබ හැම වදනේ
අරිය ධම්ම අනුනා මාහිමි සඳුනේ
අරිය මඟින් මතු දුන මැන රැකවරණේ

**'බෞද්ධ ළමයා' සංස්කාරක**

ලංකාවේ තරුණයන්ට මගේ පණිවිඩය මෙය යි: අත්තදීපා විහරථ අත්ත සරණා අනඤ්ඤ සරණා, ධම්මදීපා විහරථ ධම්ම සරණා අනඤ්ඤ සරණා, ලාබයට ඔබට රා, අරක්කු, සොසේජ් හා විස්කි දෙමින් ඔබ ලවා තමා ගේ බඩු මිල දී ගන්වන විදේශිකයා විශ්වාස නොකරන්න. දුරාචාරී වූ ද, මනුෂ්‍යයා ගේ මහාමිත්‍ර තථාගතයන් වහන්සේ සොයා ගත් ආර්ය මාර්ගයෙහි ගමන් නො කරන්නා වූ ද මිනිසා සමඟ ආශ්‍රය නො කරන්න. සිතෙන් අප ගේ දුටුගැමුණු රජු ගේ රාජධානියට ඇතුළු වන්න. අප ගේ බුද්ධාගම රැක ගත්තා වූත් අප ගේ ජාතිකත්වය අමතක විය නො දී ආරක්ෂා කර ගත්තා වූත් ඒ මහා නරපතියාණන් ගේ අදහස් හා ඔබ ගේ අදහස් අනන්‍ය කර ගන්න. විෂ මත් ද්‍රව්‍ය ඔබට පානය කරන්නට දීමෙන් ඔබේ ම රටෙහි ඔබ වහලකු කර ගැනීමට තැත් කරන, ඔබ විනාශ කිරීමට මාන බලන සතුරන් විසින් ඔබ වට කර ගනු ලැබ සිටින්නෙහි ය. මද්‍යසාරය කළල බීජයට විෂ පොවන බවත් මත්පැන් බොන පියා තම දරුවා ගේ ද දරුවා ගේ දරුවා ගේ ද සතුරකු බවත් සුජනක විද්‍යාවේ හසළ විද්‍යාඥවරු පවසති. අයුතු සේ මුදල් ඉපයීමේ අභිලාෂයෙන් අපට මත්පැන් දෙන තැනැත්තා ජාතික සතුරකු ලෙස මම සලකමි.

**ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා**

"ධර්මපාල ප්‍රතිරාවය" කෘතියෙනි



# ළමා පෙළට භාවනාව - 2

**පූජනීය ගම්පහ පාසාදික ස්වාමීන් වහන්සේ විසිනි**

පින්වත් පුතේ දුවේ,

පින්වත් දූලපුතාලට මතක ද ගිය මාසෙ පෝය දවසෙ අපි සිහිපත් කරල දීපු දේවල්. හිතේ කෙලෙස් නමැති තුවාල හදාගන්නෙ නැතිව, කෙලෙස් නමැති කටු, උල් හිතේ ඇනගන්නේ නැතිව හිත පිරිසිදුව තියා ගත්තොත් ඒ නිසාම පින්වත් පුතාල දූලට හොඳට අධ්‍යාපන කටයුතු කරගන්න පුළුවන් බව අපි කියල දුන්න නේද?

පින්වත් පුතේ දුවේ,

අපේ භාග්‍යවත් සම්බුදුරජාණන් වහන්සේ මේ ලෝකයට පහළ වුණේ සියලුම ලෝක සත්ත්වයන් කෙරෙහි පැතිරුණු අනන්ත මහා කරුණාවෙන් ම යි. අපේ බුදුරජාණන් වහන්සේ තරම් අපට ආදරේ කරපු කෙනෙක් මේ තුන් ලෝකෙ ම නෑ. අපේ ආදරණීය අම්ම තාත්තා දෙන්නටත් වඩා අපට ගොඩක් ම ආදරේ කළේ අපේ බුදුරජාණන් වහන්සේ. බුදුරජාණන්වහන්සේ හැම මොහොතක ම බලාපොරොත්තු වුණේ අපේ යහපත ම යි. අපේ දියුණුව ම යි. අපට දුකක් පීඩාවක් ඇති වෙනවට,

විපතක් කරදරයක් සිදු වෙනවට අපේ බුදුරජාණන් වහන්සේ කවදාවත් ම කැමති වුණේ නෑ. ඒ නිසා මේ ලෝකයේ පිහිටක් පිළිසරණක් බලාපොරොත්තුවෙන් හිටපු හැමකෙනෙකුට ම අපේ බුදුරජාණන් වහන්සේ පිහිට පිළිසරණ ලබල දීල ඒ හැමෝ'ට ම සැනසිල්ල ප්‍රීතිය උදාකරල දුන්න.

පින්වත් පුතේ දුවේ,

අපේ බුදුරජාණන් වහන්සේ කොච්චර නම් කරුණාවකින් ද මෛත්‍රියකින් ද මේ ධර්මය අපට දේශනා කළේ. බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ කුසගින්න, පිපාසය, ගමන්විඩාවත් නොසලකා අවුරශ්මිය, වර්ෂාව, දූවිලි සුළඟ වගේ මේ කිසි ම හිරිහැරයක් පීඩාවක් නිසාවත් දෙව් මිනිසුන්ට පිහිට පිළිසරණ වෙන එක කවදාවත් ම පැහැර හැරියෙ නෑ. මේ හිරිහැර පීඩා සියල්ලක් ම කෙලෙස් නැති සිතින් සතුටින් විඳ දරාගෙන මේ මුළු ලෝකයට ම මහා කරුණාවෙන් යහපත උදා කරල දුන්න. ඇත්තෙන් ම පින්වත් පුතේ දුවේ, මේ වගේ මහා කරුණාවක් ඇති, මහා මෛත්‍රියක් ඇති සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් අපට මුණගැසුණෙ අපේ ම පෙර පිනකට යි. අපේම වාසනාවකටයි.

පින්වත් පුතේ දුවේ,

අපේ බුදුරජාණන් වහන්සේ අපට කොච්චර නම් දේවල් කියල දුන්න ද. කථා කරන්න ඕනෑ පිළිවෙල, සිතන්න ඕනෑ පිළිවෙල වගේ ම කයින් කරන්න ඕනෑ

මොනවද කියලත් කියල දුන්නනෙ. කාගෙවත් හිතක් නොරිදෙන විදිහට පච්රුස් නොවෙන විදිහට නිවැරදිව ම කථා කරන පිළිවෙල අපට කියල දුන්නෙ අපේ සම්බුදු රජාණන් වහන්සේ. මේ ලෝකයේ කාටවත් ම කරදරයක් නොවන විදිහට බෙහෝම ලස්සන ඇවතුම් පැවතුම් ඇති කයින් කළ යුතු නිවැරදි දේවල් අපට කියල දුන්නේ අපේ සම්බුදු රජාණන් වහන්සේ ම යි. ඒ විතරක් නෙමෙයි පින්වත් පුතේ දුවේ, මේ ලෝකයේ ජීවත් වෙන කුරා කුහුඹුවකුටවත් සිතුවිල්ලකින්වත් හිංසාවක් පීඩාවක් නොකර කරුණාව මෛත්‍රිය උපදින විදිහට නිවැරදි පිළිවෙලට හිතන ආකාරය අපට කියල දුන්නෙත් අපේ බුදු රජාණන් වහන්සේ ම යි.

පින්වත් පුතේ දුවේ,

අපේ බුදු රජාණන් වහන්සේ අපට කියල දීපු විදිහට ම අපි කථා කරනව නම්, කරන්න කියල කියපු දේවල් පමණක් ම කරනව නම්, හිතන්න කියල කියපු දේවල් පමණක් හිතනව නම් අපට කවදවත් ම අයහපතක් වෙන්නේ නෑ. යහපතක් අභිවෘද්ධියක් ම යි ඇත් වෙන්නෙ.

ඒ නිසා අපේ පින්වත් පුතාල දූලා හැම වෙලේ ම උත්සාහ කරන්න ඕනෑ ඒ පිළිවෙලට ම ජීවත්වෙන්න. එතකොට පුතාල දූලගෙ හිත් කෙලෙස්වලින් කිලිටි වෙන්නෙ නෑ. හිත පිරිසිදු වෙලාමයි පවතින්නේ. හිතට කිසි ම බරක් පීඩාවක් දැනෙන්නෙ නෑ. සැහැල්ලුවක් ම යි දැනෙන්නෙ. මේ නිසා ම ගුරුවරුන් උගන්වන

දේවල් හොඳට මතක හිටිනව. පාඩම් කරන දේවල් අමතක වෙන්නෙ නැති විදිහට ම හිතේ ගබඩා වෙනව. අධ්‍යාපන කටයුතු දවසින් දවස දියුණු වෙනව. පින්වත් පුතාල දූලට කාගෙත් ආදරය සෙනෙහස වෙදටත් වඩා ලැබෙන්න පටන් ගන්නව.

පින්වත් පුතේ දුවේ,

මොන තරම් නම් අසිරියක් ද ඔයාලගෙ සිතට ඔයාලගෙ ජීවිතයට සිද්ධ වුණේ ! අපේ සම්බුදු රජාණන් වහන්සේ නිසා ම නෙ අපේ ජීවිතය මේ තරම් දියුණුවකට පත්වුණේ. ඔය දියුණුවත් එක්ක භාවනා කරල තවත් හිත දියුණු කරගන්නෙ කොහොම ද කියල ඊළඟ හද පිරුණු පෝය දවසෙ දි දැන ගනිමු.

එතෙක් පින්වත් පුතුට දුවට උතුම් තෙරුවන් සරණයි.

---

පණ්ඩිතයා (නුවණැති පුද්ගලයා) අප්‍රමාදයේ තියෙන විශේෂත්වය (අනුහස්බව, අගය) හොඳින් නුවණින් වටහාගෙන, ආර්යයන්ට ගෝචර වන අප්‍රමාදය තුළ කටයුතු කිරීම නිසා බෙහෙවින් සතුටු වෙයි.

**ධම්මපදය - අප්පමාද වග්ගය**



# පැනසිහ මහ නා සමිඳුන් වඳිමි මම...

අධ්‍යාපනඥ නදී අමා ජයසේකර සුරුවිය,
ජාතික අධ්‍යාපන ආයතනය

මීට වසර 13කට පෙර, එ නම් 2003 බිනර මස 09 වන දින අපවත් වී වදාළ අතිපූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහ නා සමිඳුන් සැදැහැ සිතින් නමදිමු.

උත්තම සුපේශල ගුණසරු නො වන නිම
මිනිසත් බවින් මතු ව ද තෙක් නිවන් හිම
රට-දැය-සසුන-දහමට දිවි දෙවන තම
පඤ්ඤාසීහ නා සමිඳුන් වඳිමි මම

දහමට සිහළ බොදු දරුවන් කර නැඹුරු
‘මිනිසා හදා රට හදමු’ යි කිවු ඇදුරු
නා හිමි ඇරැඹි සදහම් සිප් හල සොඳුරු
පුබුදයි අදත් නොඅඩු ව සුසුවඳ තඹුරු

සුපතළ ‘විදුරුනැණ’ ගුරු හිමි නම් දරන
පුරවර මහරගම සිට හොබවන දෙරණ
පින් කෙත සඟරුවන සැදි කෙලෙසුන් වරන
සොඳුරු යි, අහා, සොඳුරු යි, පැනසිහ අරණ

පුන් සඳ පොහෝ දින කලදෝ කැන්		වීදූ
කැන්දන සුදන හට නිවනට මං		පෑදූ
සුන්දර සිල් සුවඳ පිරි කුසුමන්		පීදූ
පන්සල වැදැ නිවෙමි, නිති සැනැහෙමි,		සාදූ

මෙ සසුන් කෙතෙහි රන් අස්වනු		පීදේ වා
ලක් බිම සිවුවනක් පිරිසෙන්		සුසැදේ වා
බුදු පුත් සමිඳු කළ අදිටන		සරු වේ වා
හෙළ බොදු පියුම් හිමි පා මුල		සුපිපේ වා

හුස්මයේ රිද්මයට
සිත නතුව සුපහන් ව
අඳුරු ලොව එළිය වන
සමාධි මං පෙතේ
දොර අගුළු විවර විය

සෙමෙන්
පරිස්සමෙන්
සිහියෙන්
විවර වූ දොරටුවෙන්
ඒ සොඳුරු මං පෙතේ
යා යුතු ය නිතැනින් ම

"සසුන්රුවන්"



# සිරිමතී

"මුතු සීයා" විසිනි

ආදරණීය දුවේ, පුතේ, බොහෝ කාලයකට පසු මා ළමයකු මට කියාපු ආදර්ශවත් පුංචි කතාවක් ළමයා කිවු ලෙස ම ඔබට ඉදිරිපත් කරන්නටයි යන්නේ. එය අවධානයෙන් කියවන්න. එයින් යමක් ඔබට උගත හැකිදැයි බලන්න. මෙන්න ඒ කතාව ඒ ළමයා මට කිවූ වචනයෙන් ම මා ඉදිරිපත් කරනවා.

"මුතු සීයේ, අපේ ගෙවල් කිට්ටුව එක් ආදර්ශවත් පවුලක් වාසය කරනවා. ඒ පවුලේ ඉන්නේ පස් දෙනයි. අම්මයි, තාත්තයි, අක්කයි, අයියයි, නංගියි. අයිය ගෙ නම ආරියදාස. අක්ක ගෙ නම නිර්මලා. නංගි ගෙ නම සිරිමතී. අද කියන මේ කතාව, ඒ සිරිමතී නංගී ගැනයි. ඒ සිරිමතී ගෙ වයස දොළහක් විතර ඇති.

සිරිමතී නංගි අම්මට යි - තාත්තාට යි - අයියට යි - අක්කට යි හුඟක් ආදරය කළා. අක්ක යි අයිය යි දෙන්නත් අම්මටත් තාත්තාටත් සිරිමතීටත් හුඟක් ආදරය කළා. සිරිමතී පුළුවන් හැටියට ගෙදර දොරේ වැඩපළටත් උදවු වුණා.

පසුගිය සිංහල අවුරුදු උත්සවයට කැවිලි පිඟානක් අරගෙන ඒ පවුලේ සියලු දෙනා ම අපේ නිවසට ආවා. ඇවිත් අවුරුදු චාරිත්‍ර ඉටු කළා. අපත් ඒ ලෙස ම චාරිත්‍ර ඉටු

කළා. ඒ පවුලේ ළමයි අප ගෙ නිවසේ අම්මාටත් තාත්තාටත් දෙදණ නමා නමස්කාර කරලා වැන්දා. සිරිමතී යි, අක්ක යි, අයිය යි තුන් දෙනා ම ගියේ නිවස ළඟ තිබූ ඉංග්‍රීසි පාසලට. ඈත තිබෙන උසස් ඉංග්‍රීසි පාසලට යවන්න තරම් හැකියාවක් ඒ දෙමාපියනට තිබුණේ නැහැ. ඒත් ළමයි කවුරුත් හොඳට ඉගෙන ගත්තා. අක්ක යි අයිය යි පාසලේ ශිෂ්‍ය නායිකාවක් හා ශිෂ්‍ය නායකයෙක් වුණා. පුංචි සිරිමතී පන්ති නායිකාව පමණයි. අවසානයේ පාසලේ පැවති උසස් කිරීමේ විභාග යෙන් සිරිමතී යි, අයිය යි, අක්කණ යි තුන් දෙනා ම ඒ ඒ පන්තිවල විභාග වලින් පළමු වැනි තැන් හිමි කර ගත්තා. අවුරුද්ද අවසානයේ පැවති ත්‍යාග ප්‍රදානෝත්සවයේ දී ඒ ඒ පන්ති ත්‍යාග තුන සිරිමතීටයි අක්කටයි අයියටයි හිමි වුණා. ඊට අමතර ව හොඳ ම පවුලට හිමි විශේෂ ත්‍යාගය හිමි වුණේත් සිරිමතී ගෙ පවුලට. ඒ ත්‍යාගය ගන්න සිරිමතී වේදිකාවට නගින කොට මුළු ශාලාවෙන් ම ලොකු අත් පොළසන් නාදයක් මතු වුණා. සිරිමතී ශාලාව දෙසට හැරී ආචාර කොට තම සතුට ද ප්‍රකාශ කළා.

පසු ව අපට දැන ගන්නට ලැබුණා එම උත්සවයට සහභාගි වූ ප්‍රදේශයේ දානපතියකු සිරිමතීට අධ්‍යාපනය අවසාන වන තෙක් අවශ්‍ය පොත්පත් ඇඳුම් - පැළඳුම් හා අවශ්‍ය සියලු ම ආම්පන්න මිළ දී ගැනීමට ශිෂ්‍යත්වයක් ප්‍රදානය කළ බව. සිරිමතී කොයි තරම් වාසනාවන්ත දැ”යි ඒ ළමයා ඒ කුඩා කතාව අවසන් කළා.

දුවේ, පුතේ ඔබ කවුරුත් සිරිමතී ගේ පවුලේ ළමයින් වගේ යහපත් දරුවන් වන්නට මහන්සි ගන්න.

ඔබ සැමට තෙරුවන් සරණයි !



# යළි ගමට පියමං කරමු

පූජ්‍යපාද නාවල ඤාණරතන හිමි

අරුණැල්ලේ වන ලිය ගොමු ඔපලා
කඳුරැල්ලේ රන් දියවර ගලලා
පවනැල්ලේ මුදු සුවය ම විඳලා
ගම්මානෙ ම සොඳුරු යි සිත බැඳිලා

මුදු මල් සුවඳේ පිනි ඉහිරෙන්නේ
දියරැල්ලේ සිත සිසිල ගලන්නේ
කෙත්යාය ම අස්වනු පීදෙන්නේ
ගම්මානෙ ම ඔකඳව ඔපවෙන්නේ

රළු නගරේ කහවුණු අහුලන්නට
ගියමුත් ඔබ සිය ගම හැර දුරු රට
පැමිණිය යුතු වේ ඔබ මවු තුරුලට
මුල් රැකගෙන දහමින් සැනසෙන්නට